අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2001 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2001

ඉතිහාසය I කොටස
History Part I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා

පැය එකයි
One Hour

මෙම කොටසේ ප්‍රශ්න 40ක් ඇත. සියලු ම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි වන්නේ එයින් එකක් පමණි.
ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
මෙම කොටසට ලකුණු 40ක් ලැබේ.
I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.

## I කොටස

- **අංක 01 සිට 10 තෙක් වූ ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නො ගැළපේ. එම නො ගැළපෙන** නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ **ලියන්න.**

01. (1) කදම්බ නදී (2) ක්‍රිෂ්ණ නදී (3) ගම්භීර නදී (4) ජජ්ජර නදී (5) කප්පකන්දර නදී (..........)

02. (1) හරිවංස (2) දීපවංස (3) මහාවංස (4) ථූපවංස (5) ධාතුවංස (..........)

03. (1) සීලප්පදිකාරම් (2) පට්ටිනප්පාලෙ (3) පදිර්රුපත්තු (4) තිරුවාලංගාඩු (5) මණිමෙකලායි (..........)

04. (1) ඉට්ඨිය (2) උත්තිය (3) චප්ප (4) සම්බල (5) භද්දසාල (..........)

05. (1) සක්දාමල (2) අසක්දාමල (3) දැමිය (4) සූරියබාහුය (5) විජයබාහුය (..........)

06. (1) අල්ලෙයි සන්නස (2) පනාකඩුව සන්නස (3) ඔරුවල සන්නස (4) වල්ලිපුරම් සන්නස (5) පල්කුඹුර සන්නස (..........)

07. (1) කල්‍යාණවතී (2) විහාරමහා දේවි (3) රත්නාවලී (4) සුමිත්‍රා දේවි (5) සුනේත්‍රා දේවි (..........)

08. (1) ලෑන්ඩ් රාද් (2) සිවිල් රාද් (3) රාද්ෆාක් ජුස්ටිටි (4) තේසවලාමෙයි (5) ඔපර්හූෆඩ් (..........)

09. (1) විදෙර්ඊද පසෙන්දා (2) මහබද්ද (3) කුරුවෙ බද්ද (4) මඩිගෙ බද්ද (5) ආකර බද්ද (..........)

10. (1) අනගාරික ධර්මපාල (2) ඩබ්ලිව්.ඒ.සිල්වා (3) වලිසිංහ හරිස්චන්ද්‍ර (4) එෆ්.ආර්.සේනානායක (5) පොන්නම්බලම් රාමනාදන් (..........)

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා නාම යුගල පහක් දක්වේ. ඒ අතර එහි **නො ගැළපෙන** නාම යුගලයක් ඇත. **නො ගැළපෙන** නාම යුගලය හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.

11. (1) I සේන - ශ්‍රී මාර ශ්‍රී වල්ලභ (2) IV මිහිඳු - III ක්‍රිෂ්ණ (3) V මිහිඳු - I රාජරාජ (4) I විජයබාහු - කාලිංග මාඝ (5) II පරාක්‍රමබාහු - චන්ද්‍රභානු (..........)

12. (1) භාණ්ඩාගාරික - බඩකරික (2) නගර ගුත්තික - දකපති (3) ගාම භොජක - ගමික (4) දෞවාරික - දොරතන (5) මහාමච්ච - මහමත (..........)

13. (1) ජයවාපි - බසවක්කුලම (2) කාණවාපි - මහාකනදරාව (3) මණිහීරවාපි - මහමඩගල්ල (4) පත්තපාසාණවාපි - නාච්චදූව (5) මහානාම මත්ථකවාපි - යෝධවැව (..........)

Past Papers Wiki

14. (1) සිද්ධි ලෙබ්බෙ - හින්දු අධ්‍යාපනය (2) වැලිවිට සරණංකර හිමි - භික්ෂු අධ්‍යාපනය
(3) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්.කන්නන්ගර - නිදහස් අධ්‍යාපනය
(4) කෝල්බෲක් කොමිසම - ඉංග්‍රීසි අධ්‍යාපනය (5) එච්. එස්. ඕල්කට් - ගිහි බෞද්ධ අධ්‍යාපනය (..........)

15. (1) ජෙරනිමෝද අසවේදු - කුන්ස්තන්තීනු ද සා (2) හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි - රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමි
(3) ෆ්‍රෙඩ්රික් නෝත් - රොබට් බ්‍රවුන්රිග් (4) ජෝන් ඩොයිලි - එමර්සන් ටෙනන්ට්
(5) පියදාස සිරිසේන - පුරන්අප්පු (..........)

- අංක 16 සිට 20 තෙක් වූ එක් එක් ප්‍රශ්නයක් සඳහා නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X තීරුවේ දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ ඇති නාම / ප්‍රකාශන දින වකවානු සමග කිසියම් ආකාරයකින් ගැළපේ. නමුත් ඒවා නිසි අනුපිළිවෙළකට දක්වා නැත. නිවැරදි පිළිවෙළට ගැළපූ විට, පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගය යටින් ඉරක් අඳින්න.

| | X | | Y |
|---|---|---|---|
| 16. | (i) තම්බපණ්ණි | A. | මෝදරගම් ආරු |
| | (ii) මගන | B. | කලා ඔය |
| | (iii) උරුවේල | C. | කදම්බ නදී |
| | (iv) උපතිස්සගාම | D. | කල්‍යාණි නදී |
| | (v) කල්‍යාණි | E. | ආරුවි ආරු |

(1) EABCD (2) EABDC (3) EBDCA (4) EBCDA (5) ECDBA

| | X | | Y |
|---|---|---|---|
| 17. | (i) විජයබාහු පිරිවෙන | A. | දෙව්නුවර |
| | (ii) ඉරුගල්කුලතිලක පිරිවෙන | B. | කැරගල |
| | (iii) පද්මාවතී පිරිවෙන | C. | පැපිලියාන |
| | (iv) ශ්‍රී සණානන්ද පිරිවෙන | D. | රයිගම |
| | (v) සුනේත්‍රාදේවි පිරිවෙන | E. | තොටගමුව |

(1) EABCD (2) EABDC (3) EBDCA (4) EBCDA (5) ECDBA

| | X | | Y |
|---|---|---|---|
| 18. | (i) පළමුවන පරාක්‍රමබාහු | A. | කෝට්ටේ |
| | (ii) දෙ වන පරාක්‍රමබාහු | B. | දඹදෙණිය |
| | (iii) හතර වන පරාක්‍රමබාහු | C. | දඹදෙණිය |
| | (iv) පස් වන පරාක්‍රමබාහු | D. | කුරුණෑගල |
| | (v) හය වන පරාක්‍රමබාහු | E. | පොළොන්නරුව |

(1) EABCD (2) EABDC (3) EBDCA (4) EBCDA (5) ECDBA

| | X | | Y |
|---|---|---|---|
| 19. | (i) හය වන පරාක්‍රමබාහු - සුනේත්‍රා දේවි | A. | සහෝදරයෝ |
| | (ii) හත් වන භුවනෙකබාහු - ධර්මපාල | B. | සීයා සහ මුණුබුරා |
| | (iii) මායාදුන්නෙ - පළමු වන රාජසිංහ | C. | ස්වාමිපුරුෂයා සහ බිරිඳ |
| | (iv) වීදිය බණ්ඩාර - සමුද්‍ර දේවි | D. | පියා සහ පුතා |
| | (v) පළමු වන විමලධර්මසූරිය - සෙනරත් | E. | පුතා සහ මව |

(1) EABCD (2) EABDC (3) EBDCA (4) EBCDA (5) ECDBA

| | X | | Y |
|---|---|---|---|
| 20. | (i) 1910 | A. | මැනිං - ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ |
| | (ii) 1931 | B. | ඩොනමෝර් ප්‍රතිසංස්කරණ |
| | (iii) 1947 | C. | කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ |
| | (iv) 1833 | D. | සෝල්බරි ප්‍රතිසංස්කරණ |
| | (v) 1924 | E. | කෲ - මැකලම් ප්‍රතිසංස්කරණ |

(1) EABCD (2) EABDC (3) EBDCA (4) EBCDA (5) ECDBA

- අංක 21 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයකට දක්වා ඇති A,B,C සහ D යන ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා

A සහ B පමණක් නිවැරදි නම් 1 ද
B සහ C පමණක් නිවැරදි නම් 2 ද
C සහ D පමණක් නිවැරදි නම් 3 ද
A සහ C පමණක් නිවැරදි නම් 4 ද

ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් 5 ද වරහන් තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A සහ C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

21. ශ්‍රී ලංකාවට බුද්ධාගම හඳුන්වා දීම සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේද ?
(A) දෙ වන ධර්ම සංගායනාව.
(B) සෝණ සහ උත්තර යන තෙරුවන් වහන්සේලාගේ ධර්මදූත කටයුතු.
(C) භික්ෂු ශාසනය පිහිටුවීම.
(D) භික්ෂුණී ශාසනය පිහිටුවීම. (..........)

22. පොළොන්නරුව රාජධානියේ පිරිහීම සහ බිඳ වැටීම සම්බන්ධයෙන් පහත දක්වෙන කවර සාධකය/ සාධක නිවැරදි වේ ද?
(A) සිවිල් යුද්ධ
(B) පළමු වන පරාක්‍රමබාහු රජු ගේ විදේශ ප්‍රතිපත්ති
(C) මහා සාගතය
(D) චන්ද්‍රභානු ගේ ආක්‍රමණය (..........)

23. 1521 විජයබාකොල්ලය සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) විජයබාකොල්ලය මෙහෙය වන ලද්දේ බුවනෙකබාහු, මායාදුන්නෙ සහ රයිගම්බණ්ඩාර යන කුමාරවරුන් විසිනි.
(B) විජයබාකොල්ලයෙන් පසුව කෝට්ටේ රාජ්‍යය දුර්වල විය.
(C) විජයබාකොල්ලයේ ප්‍රතිඵලය වූයේ කෝට්ටේ රාජ්‍යයෙහි ධර්මපාල (පෙරියබණ්ඩාර) රජවීමය.
(D) විජයබාකොල්ලයට පසුව කෝට්ටේ රාජ්‍යය තුළ පෘතුගීසි බලපෑම් වර්ධනය විය. (..........)

24. දෙවන රාජසිංහ රජු සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) මොහු නායක්කාර් වංශික පෙළපතට අයත් වීම.
(B) පෘතුගීසින් ශ්‍රී ලංකාවෙන් පලවා හැරීමට සමත් වීම.
(C) උඩරට රාජ්‍යයේ ස්වාධීනත්වය ආරක්ෂා කරගැනීම.
(D) උඩරට රාජ්‍යය ඉංග්‍රීසි ආධිපත්‍යය යටතට පත්වීමට මොහුගේ රාජ්‍ය පාලනය මඟ පෑදීය. (..........)

25. 1818 උඩරටියන්ගේ නැගී සිටීම සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) නායකත්වය ගත්තේ කැප්පෙටිපොළ අදිකාරම් ය.
(B) මෙය රට පුරා පැතිරී ගියේ ය.
(C) 1815 උඩරට ගිවිසුම කඩ කිරීම ප්‍රධාන හේතුව විය.
(D) රජය විසින් පනවන ලද අධික අයබදු ආසන්න හේතුව විය. (..........)

- අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

26. අනුරාධපුර යුගයේ දී ඉදි කරන ලද වටදාගේ හෙවත් චෛතියඝර ඇතුළත් ව ඇත්තේ පහත දක්වෙන කවර ලැයිස්තුවේද?
(1) ථූපාරාමය, ගිරිකණ්ඩ චෛතිය, ජේතවනය, මහාථූපය, මණ්ඩලගිරි දාගැබ
(2) ථූපාරාමය. ලංකාරාමය, කණ්ඩක චෛතිය, මණ්ඩලගිරි දාගැබ, ගිරිකණ්ඩ චෛතිය
(3) ථූපාරාමය, ලංකාරාමය, මහාථූපය, ජේතවනය, මිරිසවැටිය
(4) ථූපාරාමය, ලංකාරාමය, ජේතවනය, ගිරිකණ්ඩ චෛතිය, උත්තර චෛතිය
(5) ථූපාරාමය, ලංකාරාමය, මිරිසවැටිය, දක්ඛිණ ථූපය, මහාථූපය (..........)

27. හය වන පරාක්‍රමබාහු රජුගේ කාර්ය සංසිද්ධීන් සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශනය නිවැරදි වේද?
(1) කාලිංග මාඝ පරාජය කිරීම.
(2) කෝට්ටේ බෙදා වෙන් කිරීම.
(3) ශ්‍රී ලංකාව එක්සේසත් කිරීම.
(4) චන්ද්‍රභානු පරාජය කිරීම.
(5) පාණ්ඩ්‍ය රාජ්‍යපදප්‍රාප්ති උරුමය සඳහා වූ යුද්ධයට සහභාගි වීම. (..........)

28. මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි පාලනය පිළිබඳව හැදෑරීමට තිබෙන වැදගත්ම මූලාශ්‍රය වන ලංකාධිපත්‍යය (Conquest of Ceylon) නමැති කෘතියේ කතුවරයා කවරෙක් ද?
(1) බැල්දේස්
(2) රෙබෙයිරෝ
(3) රොබට් නොක්ස්
(4) කේරෝෂ්
(5) ද කුතෝ (..........)

29. පෘතුගීසින් සහ සිංහලයන් අතර ඇති වූ සටන්වල අනුපිළිවෙළ දක්වෙන්නේ පහත සඳහන් කවර ලැයිස්තුවේද?
(1) මුල්ලේරියාව, ගන්නොරුව, දන්තුරේ, රන්දෙනිවෙල
(2) මුල්ලේරියාව, දන්තුරේ, රන්දෙනිවෙල, ගන්නොරුව
(3) මුල්ලේරියාව, රන්දෙනිවෙල, ගන්නොරුව, දන්තුරේ
(4) මුල්ලේරියාව, ගන්නොරුව, රන්දෙනිවෙල, දන්තුරේ
(5) මුල්ලේරියාව, රන්දෙනිවෙල, දන්තුරේ, ගන්නොරුව (..........)

30. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක සභාවේ උගත් ලාංකිකයා වෙනුවෙන් වෙන් කළ ආසනයට ඡන්දයෙන් තෝරා පත් කළ නියෝජිතයා කවු ද?
(1) ඇෆ්. ආර්. සේනානායක
(2) පොන්නම්බලම් රාමනාදන්
(3) මාකස් ප්‍රනාන්දු
(4) ඩී. බී. ජයතිලක
(5) ජේම්ස් පීරිස් (..........)

- අංක 31 සිට 35 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට **නො ගැළපේ.** එම කරුණ තෝරා ඊට අදාළ **අංකය වරහන් තුළ** ලියන්න.

31. සංස්කෘතික භාෂාව
(1) සංස්කෘති භාෂාව බ්‍රාහ්මණයන් ගේ භාෂාව විය.
(2) මහායාන ධර්මය වැඩි වශයෙන් ලියා ඇත්තේ සංස්කෘත භාෂාවෙනි.
(3) පල්ලව බලපෑම සමග සංස්කෘත බසින් ඉගෙනීම වඩාත් ජනප්‍රිය විය.
(4) කුමාරදාස රජු විසින් ජානකීහරණය ලියන ලද්දේ සංස්කෘත බසිනි.
(5) මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද ථේරවාද බෞද්ධ ත්‍රිපිටකය පැවතියේ සංස්කෘත භාෂාවෙනි. (..........)

32. **අනුරාධපුර මුල් යුගයේ රජකම**
  (1) රජකම උරුම වූයේ මව් පරපුර අනුව ය.
  (2) රජ ළඟට වැදගත් වූයේ උපරාජයා ය.
  (3) රජවරු මහාරාජ උපාධි නාමය දැරූහ.
  (4) අලුත් රජ කෙනෙකු පත්වීමේදී අභිෂේක උත්සවයක් පවත්වන ලදී.
  (5) පැරණි නීති රීති සහ සංස්ථාවන් නොකඩවා පැවැත්වීම රජු විසින් කළ යුතු කාර්යයක් විය. (..........)

33. **අලගක්කෝණාර පෙළපතේ නැගීම**
  (1) අලගක්කෝණාවරු ඉඩම් හිමියන් වශයෙන් රයිගම සිය බල ප්‍රදේශය කරගෙන ප්‍රතිෂ්ඨාපනය වූහ.
  (2) අලගක්කෝණාර අලකේශ්වර නමින් ද හැඳින්විණි.
  (3) නිශ්ශංක අලකේශ්වර හතර වන බුවනෙකබාහු රජු ගේ බලවත් අමාත්‍යයෙක් විය.
  (4) වීර අලකේශ්වර චීන අධිරාජයාට දන්ත ධාතුන් වහන්සේ ලබාදීමට චෙං හෝ ට උපකාර කළේ ය.
  (5) අලකේශ්වර දේව මන්ත්‍රීශ්වර යන සොහොයුරන් දෙදෙනා සෙංකඩගල දෙවියන් ගේ දේවාලයට ගම්වර පිදූ බව සගම සෙල්ලිපියේ දක්වේ. (..........)

34. **යාපනය රාජ්‍යය**
  (1) හය වන පරාක්‍රමබාහු රජු මෙම රාජධානිය යටත් කරගත්තේ ය.
  (2) පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණෙන විට මෙය ස්වාධීන රාජ්‍යයක් විය.
  (3) පෘතුගීසීහු 1619 දී මෙම රාජධානිය යටත් කර ගත්හ.
  (4) පළමුවෙනි සංකිලි රජු පෘතුගීසීන්ගේ සතුරෙකු විය.
  (5) මෙය කුරුඳු ප්‍රදේශයක් වශයෙන් වැදගත් විය. (..........)

35. **පෘතුගීසීන්ගේ මිෂනාරි කටයුතු**
  (1) රෝමානු කතෝලික ආගම ප්‍රචාරය කළ හ.
  (2) ගොන්සල්වේස් පියතුමා කීර්තිමත් මිෂනාරිවරයෙකු විය.
  (3) අධ්‍යාපනය ඉතා වැදගත් ප්‍රචාරක මාර්ගයක් විය.
  (4) ඉගැන්වීමේ මාධ්‍යය වූයේ දේශීය භාෂාවන් ය.
  (5) ඔවුන්ගේ කටයුතු වඩාත් සාර්ථක වූයේ උඩරට රාජ්‍යය තුළ ය. (..........)

- පහත දක්වෙන අංක 36 සිට 40 දක්වා වූ ප්‍රශ්නවලට ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර විග්‍රහය දැයි තෝරා අංකය වරහන් තුළ ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2. | නිවැරදි ය. | වැරදි ය. |
| 3. | වැරදි ය. | වැරදි ය. |
| 4. | වැරදි ය. | නිවැරදි ය. |
| 5. | නිවැරදි ය. | නිවැරදි ය. පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | සීගිරි පර්වතයේ බටහිර පැත්තේ අප්සරා රූප සිය ගණනක් අඳින ලද්දේ ය. | මෙයින් සිතුවම් කිහිපයක් දැනුදු ඉතිරි වී තිබේ. මේ සිතුවම් වලින් කීපයක එක් රූපය බැගින් ද, අනික් ඒවායේ රූප යුග්මය බැගින් ද දක්නට ලැබේ. | (........) |
| 37. | අනුරාධපුර යුගයේ මුල් කාලයේදී රජුගේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ ඉඩම්වල අස්වැන්නෙන් රජුට ලැබිය යුතු පංගුවය. | ඉඩම් බද්ද සෙල්ලිපි වල දක්වා ඇත්තේ දකපති නමිනි. | (........) |
| 38. | පෘතුගීසීහු කෝට්ටේ රාජ්‍යයට නව පාලන ක්‍රමයක් හඳුන්වා දුන්හ. | ඔවුහු වෙළඳ භෝග වගාවට උනන්දු වූහ. | (........) |
| 39. | පෘතුගීසීහු මෙන්ම ලන්දේසීහු ද අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය පවත්වාගෙන යාමට කැමැත්ත දක්වූහ. | අනිවාර්ය රාජකාරි සේවා මගින් ඔවුන්ගේ වාණිජ පරමාර්ථ ඉටුකරගැනීමට හැකි විය. | (........) |
| 40. | ලන්දේසීහු ක්‍රමවත් අධිකරණ පාලනයක් ඇති කළහ. | ලන්දේසි අධිකරණ කටයුතු ස්කොලාක්වල් කොමිසම යටතේ සංවිධානය කර තිබිණ. | (........) |

Past Papers Wiki
PAST PAPERS WIKI

Past Papers Wiki

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2001 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2001

ඉතිහාසය I කොටස
History Part I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා

පැය දෙකයි
Two Hours

10 වන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න

## II කොටස

01. පණ්ඩුකාභය රජු ගේ පාලන සමයේ වැදගත්කම විචාරාත්මක ව පරීක්ෂා කරන්න. **(ලකුණු 14 යි)**

02. දිවයින එක්සේසත් කිරීමෙහි ලා මාගම පාලකයන්ගේ දායකත්වය පහත දැක්වෙන ප්‍රකාශන කෙරෙහි අවධානය යොමු කරමින් පරීක්ෂා කරන්න.

    (i) දුට්ඨගාමිණී රජු ගේ පාලන සමයේ ආරම්භයට පෙර මාගම පාලකයන් අනුගමනය කළ ප්‍රතිපත්ති

    (ii) දුට්ඨගාමිණී රජු ගේ ජයග්‍රහණය **(එක් කොටසකට ලකුණු 7 බැගිනි.)**

03. "වාරිමාර්ග පද්ධතිය පැරණි ශ්‍රී ලංකා ශිෂ්ටාචාරයේ ශ්‍රේෂ්ඨතම දායාදයන්ගෙන් එකක් ලෙස සැලකිය හැකිය." මේ කියමන අනුරාධපුර යුගය ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. **(ලකුණු 14 යි)**

04. "පළමුවන පරාක්‍රමබාහු රජු ගේ පාලන සමය විශාල කාර්ය සංසිද්ධීන්ගෙන් ගහණ වූවකි." පහත දැක්වෙන මාතෘකාවලින් **දෙකක්** උපයෝගී කරගෙන මෙම කියමන විචාරාත්මක ව විග්‍රහ කරන්න.
    (i) වාරිමාර්ග ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ පෘථුල කටයුතු
    (ii) මහා පරිමාණ ගොඩනැගිලි ඉදි කිරීමේ ක්‍රියාවලිය
    (iii) ප්‍රාදේශීය ආක්‍රමණ
    (iv) මධ්‍යගත පරිපාලන ක්‍රමය **(එක් කොටසකට ලකුණු 07 බැගිනි.)**

05. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරාගෙන ඒවායේ ඓතිහාසික වැදගත්කම සාකච්ඡා කරන්න.
    (i) පැරණි ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම
    (ii) දඹදෙණි යුගයේ සාහිත්‍ය කටයුතු
    (iii) ගම්පොළ යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය
    (iv) කෝට්ටේ යුගයේ අධ්‍යාපනය
    **(එක් කොටසකට ලකුණු 07 බැගිනි.)**

06. ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය රැකගැනීම සඳහා උඩරට රජවරුන් ගෙන ගිය ක්‍රියාකලාපය පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.
    (i) පෘතුගීසි සහ ලන්දේසි ආක්‍රමණවලින් උඩරට රාජ්‍යය ආරක්ෂා කර ගැනීම.
    (ii) බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම. **(ලකුණු 14 යි)**

07. කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණවල වැදගත්කම පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** යටතේ සාකච්ඡා කරන්න.
    (i) ආණ්ඩුක්‍රම හා පරිපාලන ප්‍රතිසංස්කරණ
    (ii) රාජකාරී සේවා ක්‍රමය අහෝසි කිරීම.
    (iii) වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම.
    (iv) අධිකරණ ප්‍රතිසංස්කරණ
    **(එක් කොටසකට ලකුණු 07 බැගිනි.)**

08. "පෘතුගීසීන් තිබුණ සම්පත් සූරාකෑමට වෑයම් කළ නමුදු ලන්දේසීහු වියදම් අවම කොට උපරිම ලාභ ලැබීමට උත්සාහ කළහ." පෘතුගීසි සහ ලන්දේසි ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මේ කියමන සාකච්ඡා කරන්න. **(ලකුණු 14 යි)**

09. පහත සඳහන් මාතෘකා වලින් **දෙකක්** යටතේ කෙටි සටහන් ලියන්න.
    (i) අරුමුග නාවලර්
    (ii) 1915 සිංහල මුස්ලිම් කෝලාහලය
    (iii) ලංකා ජාතික සංගමය
    (iv) ඒ. ඊ. ජයා
    (v) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ අමාත්‍ය මණ්ඩලය **(එක් කොටසකට ලකුණු 07 බැගිනි.)**


10. ඔබට සපයා ඇති සිතියමෙහි අංක 1 ගංගාවකි. අංක 2 පැරණි වරායකි. අංක 3 පොළොන්නරු යුගයේ දී ඉදිකරන ලද වැවකි. අංක 4 රෝහණ රාජ්‍යයේ පැවති අගනගරයකි. අංක 5 පැරණි අග නගරයකි. අංක 6 1638 දී සටන් පැවති ප්‍රදේශයකි. අංක 7 වරායකි. අංක 8 පළාතකි. ඒ සියලු ම ස්ථාන සපයා ඇති සිතියමෙහි නම් කොට ඉන් **දෙකක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
    **(නම් කිරීමට ලකුණු 1 බැගිනි. කෙටි සටහනකට ලකුණු 5 බැගිනි.)**



PAST PAPERS WIKI
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2001 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2001

ප්‍රශ්න අංකය 10 විභාග අංකය.......................................................




WWW.PastPapers.WiKi

නොමිලේ බෙදාහැරීම පිණිස පමණි

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library